# <u>7.3 වෙබ් අඩවි සංවර්ධනය – පැවරුම Home Assignment-2</u>

7.3 පළමු පැවරුමේ සකස් කල ක්‍රියාකාරකම අනුව මේ වන විට පහත කේත අඩංගු වෙබ් පිටුවක් ඔබ නිර්මාණය කර ඇත. එම වෙබ් පිටුව ට අදාල notepad ගොනුව නැවත විවෘත කර ගැනීමට, වෙබ් පිටුව මත right click කර Open with notepad ලබා දෙන්න.

```
<html>
<head>
<title>
Preparing a Document for the World Wide Web
</title>
</head>
<body>
<h1>Preparing a Document for the World Wide Web</h1>
</body></html>
```

Headings - ශීර්ෂ එක් කිරීම -

ලේඛනයේ සංවිධානය සාර්ථක වීමට එහි ශීර්ෂයන් ඵලදායී ලෙස භාවිතා කල යුතුය . HTML හි ශීර්ෂ /මාතෘකා මට්ටම් හයක් ඇත. මේ මට්ටම් සන්සන්දනය කර බැලීමට notepad ගොනුවේ <body> හා </body> යන කොටස් අතර ට පහත කේත කොටස එක් කර නැවත සුරක්ෂිත (save) කර ගන්න.

```
<h1>Heading level 1</h1> most important

<h2>Heading level 2</h2>

<h3>Heading level 3</h3>

<h4>Heading level 4</h4>

<h5>Heading level 5</h5>

<h6>Heading level 6</h6>
```

<u>**ඡේද එක් කිරීම (Adding Paragraphs)** – එම</u> notepad ගොනුවට විවෘත කර පහත කොටස් ඇතුලත් කරන්න.

```
<p>

Creating HTML pages takes planning,but the results are worthwhile.Imagine the excitement of having your Web page seen by people all over the world.

</p>

<p>    Keep your Web pages to a few screens each. You can link information together, so don't worry about ncluding everything at once.

</p>
```

<p>

Remember that readers do not always find your home page first. A link from somewhere else can lead them to the middle of your information, so try not to use words like

<br /> back<br /> forward<br /> previous<br /> next <br /> to indicate navigation on your pages.

</p>

ඡේද සඳහා <p> ඇතුළු කිරීමෙන් ඡේද අතර වෙන් කිරීම් දක්වයි.

<br /> මගින් පේළි අවශ්‍ය තැන්හිදී කඩා පහලින් ලියා දැක්වීමට හැකිවේ.

<u>පින්තූර ඇතුළු කිරීම</u>

**පහත කේතය ඔබේ notepad ගොනුවේ <body> </body > කේත අතර ඇතුළු කරන්න. එසේම පහත පින්තූරය හෝ වෙනත් පින්තූරයක් ඔබගේ වෙබ් සහිත පිටුව තුල සුරක්ෂිත** anuradhapura.jpg නමින් සුරක්ෂිත කර තිබිය යුතුය. එහි වර්ගය jpg විය යුතුය.

```
<img src="anuradhapura.jpg" alt="Maha seya">
```



දැන් නැවත ctrl +s මගින් හෝ file -- > save මගින් notepad file එක සුරක්ෂිත කර එම ගොනුව right click කර වෙබ් අතරික්සුව හරහා විවෘත කරන්න. එවිට මේ වන විට නිර්මාණය කර ඇති වෙබ් පිටුව දැකිය හැකිවේ.

<u>අකුරු වර්ණ ගැන්වීම</u>

HTML 5 යටතේ <font> කේතය ක්‍රියාත්මක නොවන හෙයින් ඒ වෙනුවට එම කාර්යය සිදු කිරීමට

```
<p style="color:red">This is a paragraph.</p>
<p style="color:blue">This is another paragraph.</p>
```

යන කේත භාවිතා කිරීමට සිදුවේ. ඔබගේ notepad ගොනුව දිග හැර පහත කේත එක් කර අකුරු වර්ණ ගන්වා සුරක්ෂිත කර වෙබ් බ්‍රව්සරය මගින් වෙබ් පිටුව නරඹන්න.

```
<p style="color:red">
Not Supported in HTML5.

The <font> tag was used in HTML 4 to specify the font face, font size, and color of text. </p>
```